# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# ඇබෑර්තු

## මූල්‍ය අංශ ප්‍රධානී තනතුර

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව, වෛද්‍ය ආඥා පනත (105 අධිකාරිය) මගින් ස්ථාපිත, ශ්‍රී ලංකාවේ වෛද්‍ය, දන්ත වෛද්‍ය සහ අනෙකුත් සෞඛ්‍ය සත්කාරක වෘත්තිකයන් සඳහා වන නියාමන අධිකාරිය වේ.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මූල්‍ය ප්‍රධානී තනතුර සඳහා යෝග්‍ය සුදුසුකම්ලත් පුද්ගලයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අපේක්ෂකයා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර පූර්ණකාලීන නිලධාරියෙකු වනු ඇත.

**පහත කරුණු අදාළ කාර්යයට අයත් වේ.**

1. අදාළ භාණ්ඩාගාර පාලනයන් සහතික කරමින් සභාවේ මුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.
2. තීරණාත්මක ව්‍යාපාරික තීරණ ගැනීමට හැකිවන පරිදි පැහැදිලි සම්පූර්ණ තාක්ෂණික සහය සහ අවබෝධය ලබා දීම.
3. මූල්‍ය සහ කළමනාකරණ තොරතුරු සැකසීම
4. ඵලදායී අය වැය පාලනය සහ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි.
5. ආයෝජන සහ මුදල් කළමනාකරණය.

**යෝග්‍ය අපේක්ෂකයා සතුවිය යුතු සුදුසුකම්**

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, ගිණුම්කරණය/ වාණිජ්‍යය සඳහා ගෞරව සාමාර්ථ සහිත මූලික උපාධියක් සමග ICASL, CIMA, ACCA හෝ ACMA වැනි වෘත්තීය ගිණුම්කරණ ආයතනයක අන්තර් මධ්‍ය විභාග සුදුසුකම.
2. <u>සාර්ථකත්වය සනාථ කළ හැකි වාර්තාවක් සහිතව, ජ්‍යෙෂ්ඨ මූල්‍ය කළමනාකරණ තනතුරක අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් තිබීම.</u>
3. පරිගණක සාක්ෂරතාව පිළිබඳ ප්‍රවීණතාවය
4. ඉංග්‍රීසි භාෂාවෙහි ලිඛිත සහ කථන දෙඅංශයෙන්ම සුවිශේෂී සන්නිවේදන කුසලතා
5. ස්වාධීනව වැඩ කිරීමේ හැකියාව සහ සෑම විටම රහස්‍යභාව්‍ය සහ වෘත්තියභාවය රැකගැනීමට ඇති හැකියාව.
6. විශිෂ්ට කණ්ඩායම් හැඟීම සහ නිවැරදි කාර්ය ආචාර ධර්ම
7. මූල්‍ය රෙගුලාසි සහ ප්‍රසම්පාදන පටිපාටි සහ විගණනය ඇතුළුව රාජ්‍ය මූල්‍ය ක්‍රමවේද පිළිබඳ දැනුම සහ පළපුරුද්ද සහිත වීම.

**වයස -** රජයේ චක්‍රලේඛයන්හි දක්වා ඇති කොන්දේසි ප්‍රකාරව වේ.

<u>**වැටුප -** HM-1-1-2016 රු. [86,865-15X2,270-120,915]</u>

**බඳවා ගැනීමේ පටිපාටිය -** සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනීම සිදු කෙරේ.

මෙය ස්ථිර තනතුරක් වන අතර, වසර තුනක පරිවාස කාලයකට යටත් වේ.

**සටහන :** <u>අවශ්‍ය සුදුසුකම් සහිත දැනට රාජ්‍ය ව්‍යවසායක හෝ රාජ්‍ය ආයතනයක සේවයේ නියුතු සහ ද්විතීයික පත්වීමක් සඳහා උනන්දුවක් දක්වන අයදුම්කරුවන්ද මේ සඳහා අයදුම් කිරීමට උනන්දු කෙරේ.</u>

**අයදුම් කිරීමේ පිළිවෙළ :**

අයදුම්කරුවන් සම්පූර්ණ ජීව දත්ත පත්‍රයක්, ආවරණ ලිපියක් (අයදුම්කරු රාජ්‍ය අංශයෙහි දැනටමත් සේවයේ යෙදෙන්නේ නම්, තෝරාගනු ලැබුවහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් සහිතව අදාළ ආයතන ප්‍රධානියා මගින්) සහිතව 2025.09.01 වන දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනය වෙත එවිය යුතුය. අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි සඳහන් කළ යුතුය. අයදුම්පත් ලියාපදිංචි තැපැල මගින් හෝ පහත දක්වෙන විද්‍යුත් තැපැල මගින් හෝ ඉදිරිපත් කළ හැක.

**වෛද්‍ය එච්.ඩී.බී. හේරත්**
**ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව,**
**31, නොරිස් කැනල් පාර, කොළඹ 10.**
**<u>registrar@slmc.gov.lk</u>**
**2025.08.17**